**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ පර්යේෂණ සහකාර (තාවකාලික) තනතුර සඳහා සුදුස්සන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් 2025.08.15 දින දක්වා භාර ගනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

අදාළ විෂයෙහි පළමු පන්තියේ හෝ දෙවන පෙළ (ඉහළ) විශේෂවේදී උපාධියක් ලබා තිබීම.

**හෝ**

අදාළ විෂයෙහි දෙවන පෙළ (පහළ) විශේෂවේදී උපාධියක් ලබා තිබීම.

**හෝ**

අදාළ විෂයෙහි සාමාන්‍ය සාමර්ථයක් සහිතව කලා හෝ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

**විශේෂ සුදුසුකම් :**

1. ඉංග්‍රීසි භාෂා නිපුණත්වය
2. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ නිපුණත්වය
3. දෘශ්‍ය කලාව පිළිබඳව දැනුම සහ සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**මාසික වැටුප :** U-AC 2 - 2025 (2025.04.01 දිනට වැටුප) රු.67,494.00/- සහ අනුමත අනෙකුත් දීමනා

**අයදුම්කරුවන් සඳහා උපදෙස් :**

1. උක්ත තනතුර සඳහා වන අයදුම්පත් (www.vpa.ac.lk) ලබා ගත හැකිය.
2. සියළු අයදුම්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ ජීව දත්ත සටහනක් ඉදිරිපත් කළ යුතුවේ.
3. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.08.15 දින ප.ව.4.00ට හෝ ඊට ප්‍රථම " **සහකාර ලේඛකාධිකාරී/දෘශ්‍ය කලා පීඨය නොː46, හෝර්ටන් පෙදෙස, කොළඹ 07."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
4. අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණු සනාථ කෙරෙන සේවා සහතික ඇතුළු අදාළ සියලු සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. අදාළ සහතික පත්‍ර පිටපත් අමුණා නොමැති අයදුම්පත් අසම්පූර්ණ ලෙස සැලකෙන අතර ඇගයීමට භාජනය නොවෙනු ඇත.
5. රාජ්‍ය සේවයේ සහ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධාන මඟින් එවිය යුතුය.
6. ඉහත 1, 2, 3, 4, 5 කරුණු අසම්පූර්ණ, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2025.08.01